# අභ්‍යන්තර සටහන

## පළාත් මහ රෝහල - බදුල්ල

| | |
|---|---|
| දිනය | 2023-02- 20 |
| වෙත | සියළුම කාර්ය මණ්ඩලය වෙත |
| වෙතින් | අධ්‍යක්ෂ |
| පිටපත් | කාර්ය මණ්ඩල අංශ ප්‍රධානීන්/පෞද්ගලික ලිපිගොනු විෂය භාර නිලධාරින්/නිවාඩු විෂය භාර නිලධාරින් |
| විෂයය | විදේශ නිවාඩු අනුමැතිය විධිමත්ව ලැබීමෙන් පසු පමණක් විදේශ ගත වීම |
| ගොනු අංකය | BD/PGH/CPMA/1/2013 |

රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් මෙරටින් බැහැර ගත කිරිම සඳහා විධිමත් අනුමැතිය ලබා තිබිය යුතු වුවත්, රැකියා අවස්ථා,අධ්‍යයන කටයුතු,පෞද්ගලික සංචාර,වෛද්‍ය ප්‍රතිකාර හෝ වෙනත් අවශ්‍යතාවයන් සඳහා විදේශගතවීමට ඉල්ලුම් කර, සෞඛ්‍ය ලේකම්ගේ විධිමත් අනුමැතිය ලැබී නොතිබියදී ඇතැම් නිලධාරින් විදේශගතවීමේ අවස්ථා කිහිපයක් මේවනවිට මා වෙත වාර්තා වී ඇත.

එබැවින්, යම් නිලධාරියෙකු විදේශ නිවාඩු ඉල්ලුම්කරන්නේනම්, ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 1.4 වගන්තිය අනුව විදේශ නිවාඩුව ආරම්භවන දිනට මාස තුනකට අඩු නොවන කාලයකට කලින් අදාළ සියළු ලේඛන සමඟ සම්පූර්ණ කරන ලද විදේශ නිවාඩු අයදුම්පතක් (පොදු 126) ඉදිරිපත් කර, සෞඛ්‍ය ලේකම්ගේ විධිමත් අනුමැතිය ලැබීමෙන් පසු පමණක් විදේශ නිවාඩු ලබා ගන්නා ලෙස දැනුම් දෙමි.

සෞඛ්‍ය ලේකම්ගේ විධිමත් අනුමැතියක් නොලබා විදේශගතවන නිලධාරින්ගේ වැටුප් ගෙවීම අත්හිටුවනු ලබන බවත්, විධිමත් අනුමැතියකින් තොරව විදේශගතවීම හේතුවෙන් තනතුර අතහැරයාමේ නියෝගය නිකුත් කිරීමට හැකි බවත් මෙයින් දැනුම් දෙමි.

විධිමත්ව විදේශ නිවාඩු අනුමත කර ගැනීමෙන් පසු විදෙස් ගත වන නිලධාරින්, විදේශ නිවාඩු සඳහා අනුමැතිය ලද කාලපරිච්ඡේදය අවසන් වූ දිනයේදී නැවත දිවයිනට පැමිණ, සෞඛ්‍ය ලේකම් වෙත වාර්තා කර, මෙම රෝහලේ සේවය සඳහා වාර්තා කළ යුතු බවද මෙයින් දැනුම් දෙමි. විදේශ නිවාඩු අනුමත කාලය අවසන්ව නියමිත දිනයේදී සේවයට වාර්තා නොකරන නිලධාරින්ටද සේවය හැර යාමේ නියෝගය නිකුත් කළ හැකි බවද වැඩිදුරටත් දැනුම් දෙමි.

Director
Provincial General Hospital
Badulla.